# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ඉන්දිරා පිළිකා පුණ්‍යාධාර භාරය (සංස්ථාගත කිරීමේ)

**ඉන්දිරා පිළිකා පුණ්‍යාධාර භාරය සංස්ථාගත**
**කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ගම්පහ දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු හර්ෂණ රාජකරුණා මහතා විසින්
2026 පෙබරවාරි මස 17 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2026 පෙබරවාරි මස 05 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[52 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 58.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ඉන්දිරා පිළිකා පුණ්‍යාධාර භාරය (සංස්ථාගත කිරීමේ)

## ඉන්දිරා පිළිකා පුණ්‍යාධාර භාරය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව

“ ඉන්දිරා පිළිකා පුණ්‍යාධාර භාරය” යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සහ සඳහන් කරනු ලබන භාරයක්, එකී භාරයේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුව, එකී භාරයට සම්බන්ධ සියලු කරුණු ඵලදායි ලෙස ක්‍රියාත්මක කිරීමේ හා කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් ශ්‍රී ලංකාවේ පිහිටුවා තිබූ හෙයින් ද:

එකී භාරය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කාරණා සඳහා ද, ඒ පරමාර්ථ සහ කාරණා මෙතෙක් කල් එකී භාරය විසින් සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති හෙයින්ද, එකී භාරය සංස්ථාගත කරන ලෙස ඉල්ලා ඇති බැවින් ද, ඒ ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස යෝග්‍ය වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

ලුහුඬු නාමය

**1.** මේ පනත 2026 අංක      දරන ඉන්දිරා පිළිකා පුණ්‍යාධාර භාරය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඉන්දිරා පිළිකා පුණ්‍යාධාර භාරය සංස්ථාගත කිරීම

**2.** (1) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින්මතු “ භාරය” යනුවෙන් සඳහන් කරනු ලබන) ඉන්දිරා පිළිකා පුණ්‍යාධාර භාරයේ දැනට සාමාජිකයන්ව සිටින තැනැත්තන් සහ මෙයින් පිහිටුවනු ලබන සංස්ථාපිත මණ්ඩලයට සාමාජිකයන් වශයෙන් මින් මතු ඇතුළත් කරනු ලබන තැනැත්තන් (මෙහි මින්මතු “ සංස්ථාපිත මණ්ඩලය” යනුවෙන් හඳුන්වනු ලබන) “ ඉන්දිරා පිළිකා පුණ්‍යාධාර භාරය” යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාපිත මණ්ඩලයක් විය යුතු ය. තවද එකී නාමයෙන් ඒ සංස්ථාපිත මණ්ඩලය විසින් ද, එයට විරුද්ධව ද, සියලු අධිකරණවල දී නඩු පවරනු ලැබිය හැකි අතර පොදු මුද්‍රාවක් තබා ගැනීමේ ද, එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඊට ඇත්තේය.

PL 15669 - 117 (2026/02)

(2) සංස්ථාපිත මණ්ඩලය, 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා ස්වේච්ඡා සමාජ සේවා සංවිධානයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ පොදු පරමාර්ථ

**3.** සංස්ථාපිත මණ්ඩලය පිහිටුවනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද, ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි, පහත සඳහන් සේවාවන් නොමිලේ සැපයීම විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:-

(අ) රෝග වැළැක්වීම, කල්තියා හඳුනා ගැනීම, රෝග විනිශ්චය, ප්‍රතිකාර සහ වේදනාව අඩු කිරීමේ සහන සත්කාර ඇතුළුව, පිළිකා රෝගීන් සඳහා අවශ්‍ය වෛද්‍ය සේවා සැපයීමට පහසුකම් සැලසීම;

(ආ) පිළිකා වැළැක්වීම සහ පිළිකා රෝගීන් සංඛ්‍යාව අඩු කිරීම සඳහා පිරිවැය - ඵලදායි සහ දිගු කාලීන උපාය මාර්ග ප්‍රවර්ධනය කිරීම;

(ඇ) සාර්ථක ප්‍රතිකාර විධි පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම සඳහා හැකි මුල්ම අවධියේදීම රෝග ලක්ෂණ සහිත පිළිකා රෝගීන් හඳුනා ගැනීම කෙරෙහි අවධානය යොමු කිරීම;

(ඈ) ප්‍රාථමික සෞඛ්‍ය සේවා සහ ප්‍රජා පාදක සත්කාර අවධාරණය කරමින්, ළමුන් සඳහා වේදනාව අඩු කිරීමේ නේවාසික සහන සත්කාර සහ පිළිකා රෝගී දරුවන් සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් සඳහා නවාතැන් පහසුකම් ද ඇතුළුව වේදනාව අඩු කිරීමේ සහන සත්කාර සඳහා වූ ප්‍රවේශය ඇති කිරීම;

(ඉ) පිළිකා රෝගීන්ගේ සහ ඔවුන්ගේ පවුලේ සාමාජිකයින්ගේ, මානසික හා සමාජීය යහ පැවැත්ම සහ ජීවන තත්ත්වය වැඩි දියුණු කිරීම;

(ඊ) පිළිකා රෝගීන්ගේ ජීවිතය නඟා සිටුවීම සඳහා ඔවුන්ගේ සෞඛ්‍ය සම්පන්න ජීවිතය පවත්වා ගැනීමට සහාය වීම;

(උ) ආර්ථික බලගැන්වීම සහ ජීවනෝපාය ආධාරක වැඩසටහන් හරහා පිළිකා රෝගීන්ගේ දරිද්‍රතාවය තුරන් කිරීම;

(ඌ) රෝගය වැළැක්වීමේ උපාය මාර්ග වැඩිදියුණු කිරීම සහ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් පවත්වා ගැනීම සඳහා අධ්‍යාපනික මුලපිරීම් ඇති කිරීම;

(එ) දරිද්‍රතාවය වැළැක්වීම සහ ඉන් මිදීම සඳහා දුප්පත්, අසරණ සහ ආබාධිත පිළිකා රෝගීන්ට සහන සහ ආධාර සැපයීම;

(ඒ) පිළිකා රෝගී දරුවන්, ඔවුන්ගේ රැකබලා ගන්නන් සහ පවුලේ සාමාජිකයින් සඳහා සුහසාධන නිවාස ස්ථාපිත කිරීම සහ ඒවා නඩත්තු කිරීම;

(ඔ) මහජනතාවගේ සෞඛ්‍ය වැඩි දියුණු කිරීම අරමුණු කරගනිමින්, පොදු ජනතාවට ප්‍රතිලාභ සැලසෙන යෝජනා ක්‍රම පවත්වාගෙන යාම සහ ඒවාට සහාය දීම;

(ඕ) පිළිකා රෝගීන් නින්දාවට ලක්වීම වැළැක්වීම; සහ

(ක) පිළිකා රෝගීන්ගේ ජීවිත බේරා ගැනීමට කටයුතු සිදු කිරීම.

රජයේ හෝ පළාත් සභාවක අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක කටයුතු සමග ගැටුම් ඇති නොවන බවට සංස්ථාපිත මණ්ඩලය සහතික විය යුතු බව

**4**. සංස්ථාපිත මණ්ඩලය විසින් සිය පරමාර්ථ ලිඛිත නීතිවලට අනුකූලව ක්‍රියාත්මක කළ යුතු අතර, එම පරමාර්ථ, ආණ්ඩුවේ යම් අමාත්‍යාංශයක් හෝ දෙපාර්තමේන්තුවක් විසින් හෝ යම් පළාත් සභාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් ඊට සමගාමීව කරගෙන යනු ලබන ක්‍රියාවක් සමඟ ගැටුම් සහගත තත්ත්වයක් ඇති නොවන ආකාරයෙන් ක්‍රියාත්මක කළ යුතු ය.

**සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම**

**5.** (1) මේ පනතේ විධිවිධානවලට සහ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම සහ පරිපාලනය කිරීම, මේ පනතේ 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මගින් නිශ්චිතව දක්වනු ලබන ධුර දරන්නන්ගෙන් සමන්විත වන (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සභාවක් විසින් සිදු කරනු ලැබිය යුතු ය.

(2) (අ) මේ පනත ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරනු ලබන භාරයේ සභාවේ සාමාජිකයින් (ආ ) ඡේදය යටතේ සාදනු ලබන රීතිවලට යටත්ව, 7 වන වගන්තිය යටතේ සාදනු ලබන රීති මඟින් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ප්‍රථම සභාව පත් කරනු ලබන තෙක් හෝ තෝරා පත්කර ගනු ලබන තෙක්, සංස්ථාපිත මණ්ඩලයේ අතුරු සභාව ලෙස කටයුතු කළ යුතු ය.

(ආ) 7 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධි විධානවලට අනනුකූල නොවන පරිදි සංස්ථාපිත මණ්ඩලයේ අතුරු පරිපාලනය සඳහා සහ සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම සභාවේ සාමාජිකයන් තෝරා පත්කර ගැනීම හෝ පත්කර ගැනීම සඳහා රීති සෑදීමට සංස්ථාපිත මණ්ඩලයේ අතුරු සභාවට බලය ඇත්තේ ය.

(ඇ) අතුරු සභාවේ යම් තීරණයක් එම රැස්වීම සඳහා පැමිණ සිටින සාමාජිකයන්ගේ බහුතර කැමැත්ත මත ගනු ලැබිය යුතු ය.

(ඇ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට අවුරුද්දක කාලයක් ඇතුළත සංස්ථාපිත මණ්ඩලයේ ප්‍රථම සභාව පත් කිරීම හෝ තෝරා පත් කර ගැනීම කළ යුතු ය.

(3) (අ) අනුශාසකවරුන් සහ උපදේශකවරුන් ඇතුළුව සභාවේ සෑම ධුර දරන්නකුම අවුරුදු තුනක කාලයක් සඳහා පත්කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු අතර, එම අවුරුදු තුනක

කාලසීමාව ඉකුත් වීමෙන් පසුව ඒ ධුර දරන්නා, අනුශාසකවරයා හෝ උපදේශකවරයා නැවත පත්කර ගැනීම හෝ තෝරා පත්කර ගැනීමට සුදුස්සකු වන්නේ ය.

(ආ) යම් ධුර දරන්නකු මිය යාම, ඉල්ලා අස්වීම, අකාර්යක්ෂමතාවය හෝ ධුරයෙන් ඉවත් කිරීම නිසා ධුරයක පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක දී, සභාව විසින් සංස්ථාපිත මණ්ඩලයේ රීති සැලකිල්ලට ගෙන එම පුරප්පාඩුව පිරවීම සඳහා යම් තැනැත්තකු තෝරා ගැනීම හෝ තෝරා පත්කර ගැනීම කළ යුතු ය.

(ඇ) (ආ) ඡේදය යටතේ තෝරාගත් හෝ තෝරා පත්කර ගනු ලැබූ තැනැත්තා ඔහු අනුප්‍රාප්තවන සාමාජිකයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

සංස්ථාපිත මණ්ඩලයේ බලතල

**6**. මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන වලට යටත්ව, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීමේ කාර්යය සඳහා පහත සඳහන් සියලු ක්‍රියා සහ කාරණා කිරීමේ, ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය සංස්ථාපිත මණ්ඩලයට තිබිය යුතු ය:-

(අ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා අවශ්‍ය වන්නා වූ ඉඩම් හෝ ගොඩනැගිලි මිල දී ගැනීම, කුලියට ගැනීම, ඉදිකිරීම, අලුත් වැඩියා කිරීම සහ අන්‍යාකාරයෙන් ලබා ගැනීම සහ සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි ඒවා සම්බන්ධයෙන් ක්‍රියා කිරීම හෝ ඒවා බැහැර කිරීම;

(ආ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටු කර ගැනීම සඳහා හෝ එහි බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන පරිදි ඍජුව හෝ සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සම්බන්ධයෙන් බලය පවරන ලද නිලධරයකු හෝ අනුයෝජිතයකු මාර්ගයෙන් යම් කොන්ත්‍රාත්තු හෝ ගිවිසුම්වලට ඇතුළත් වීම, ක්‍රියාත්මක කිරීම හෝ කරගෙන යාම;

(ඇ) ඇප සහිතව හෝ රහිතව මුදල් ණයට ගැනීම සහ රැස්කිරීම සහ මුදලින් හෝ ද්‍රව්‍ය වලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග ලබා ගැනීම:

එසේ වුව ද, සංස්ථාපිත මණ්ඩලය වෙත ලබා දෙන සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන් සභාව විසින් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඈ) විනිමය බිල්පත්, චෙක්පත්, පොරොන්දු නෝට්ටු සහ වෙනත් ගනුදෙනු කළ හැකි සාධන පත්‍ර සකස් කිරීම, ලිවීම, භාරගැනීම, වට්ටම දීම, පිටසන් කිරීම, ගනුදෙනු කිරීම, මිලට ගැනීම, විකිණීම සහ නිකුත් කිරීම සහ සභාව විසින් අනුමත කරනු ලබන ඕනෑම බැංකුවක ගිණුම් විවෘත කිරීම, ක්‍රියාත්මක කිරීම, පවත්වාගෙන යාම සහ වසා දැමීම;

(ඉ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා වහා අවශ්‍ය නොවන යම් අරමුදල් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයකින් ආයෝජනය කිරීම;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති යම් නීත්‍යානුකූල භාරයක් හෝ නිශ්චල හෝ පෞද්ගලික දේපළක් භාර ගැනීම, පිළිගැනීම, ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම සහ පරිපාලනය කිරීම;

(උ) සංස්ථාපිත මණ්ඩලයේ නිලධරයන් සහ වෙනත් සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම, සේවයෙන් පහ කිරීම, සේවය අවසන් කිරීම සහ ඔවුන් විෂයයෙහි විනය පාලනය පවත්වා ගෙන යාම සහ සංස්ථාපිත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි වැටුප්, දීමනා සහ පාරිතෝෂික ගෙවීම;

(ඌ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීමේ අරමුණ ඇතිව දේශන, සම්මන්ත්‍රණ සහ සමුළු සංවිධානය කිරීම;

(එ) සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති අනෙකුත් දේශීය හා විදේශීය ආයතන සමඟ සම්බන්ධතා පනත්වා ගෙන යාම සහ සම්බන්ධීකරණය කිරීම; සහ

(ඒ) සංස්ථාපිත මණ්ඩලයේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ දී හෝ විදේශයන්හි දී නිලධරයන් සහ වෙනත් සේවකයන් පුහුණු කිරීම.

සංස්ථාපිත මණ්ඩලයේ රීති

**7.** (1) සංස්ථාපිත මණ්ඩලය විසින්, කලින් කල යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන්, පහත සඳහන් සියලු කාරණා හෝ ඉන් කිසිවක් සඳහා, මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියකට අනනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල විය යුතු ය :-

(අ) සාමාජිකත්වය වර්ග කිරීම, සාමාජිකයන් විසින් ගෙවිය යුතු ගාස්තු නිර්ණය කිරීම, සාමාජිකයන් ඇතුළත් කර ගැනීම සහ සාමාජිකයන් ඉවත් කිරීම, නෙරපීම හෝ ඉල්ලා අස්වීම;

(ආ) පහත නම් සඳහන් සභාවේ ධුර දරන්නන් තෝරා පත්කර ගැනීම, ධුර දරන්නන් ධුරය හිස් කිරීම හෝ ධුරයෙන් ඉවත් කිරීම සහ ධුර දරන්නන්ගේ බලතල, කාර්යය සහ කර්තව්‍ය;

(ඇ) සංස්ථාපිත මණ්ඩලයේ විවිධ නිලධරයන් සහ සේවකයන් පත්කිරීමේ නියම සහ කොන්දේසි, ඔවුන්ගේ බලතල, කාර්යය හා කර්තව්‍ය;

(ඈ) සංස්ථාපිත මණ්ඩලයේ හෝ සභාවේ යම් රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්යය පටිපාටිය, එම රැස්වීම් පිළිබඳ දැන්වීම් හා න්‍යාය පත්‍ර, ගණපූරණය සහ එම රැස්වීම් වල කටයුතු කරගෙන යාම;

(ඉ) සභාවේ සහ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයකු වීමට අවශ්‍ය සුදුසුකම් හා නුසුදුසුකම්;

(ඊ) සංස්ථාපිත මණ්ඩලයේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම;

(උ) සාමාන්‍යයෙන් සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු කළමනාකරණය කිරීම හා එහි පරමාර්ථ ඉටුකිරීම සහ සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීම.

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදන ලද යම් රීතියක්, මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ සාදන ලද රීතියක් මෙන් එවැනිම රැස්වීමක දී එම ආකාරයෙන්ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) (1) වන වගන්තිය යටතේ සාදනු ලැබූ රීති, එකී රීති සාදනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එකී පළ කරනු ලැබූ දිනයේ සිට බලාත්මක විය යුතු ය.

(4) සංස්ථාපිත මණ්ඩලය විසින් සාදනු ලබන සෑම රීතියක්ම, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දිනයේ සිට මාස තුනක් ඇතුළත අනුමැතිය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතු වේ. පාර්ලිමේන්තුව විසින් අනුමත නොකරන ලද සෑම රීතියක්ම, එකී අනුමත දිනයේ සිට පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් හානියක් සිදු නොවිය යුතු ය.

(5) ඉහත (4) උපවගන්තිය යටතේ එවැනි ඕනෑම රීතියක් පරිච්ඡින්න වූ ලෙස සලකනු ලබන දිනය පිළබඳ නිවේදනයක් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු වේ.

(6) සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් සෑම කල්හිම සංස්ථාපිත මණ්ඩලයේ බලපවත්වන රීතිවලට යටත් විය යුතු ය.

**8.** සාමාජිකයන්ගේ නම්, ලිපිනය සහ වෙනත් අත්‍යවශ්‍ය තොරතුරු ඇතුළත් කරනු ලැබිය යුතු සාමාජිකයන්ගේ ලේඛනයක් සභාව විසින් පවත්වාගෙන යා යුතු ය.

සාමාජිකයන්ගේ සාමාජික ලේඛනය

**9.**(1) සංස්ථාපිත මණ්ඩලයට එහි ම අරමුදලක් තිබිය යුතුය.

සංස්ථාපිත මණ්ඩලයේ අරමුදල

(2) සංස්ථාපිත මණ්ඩලය සඳහා සහ ඒ වෙනුවෙන් ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග, සාමාජික මුදල්, දායක මුදල්, ගාස්තු හෝ ප්‍රදාන වශයෙන් ලැබුණු සියලු මුදල්, 6 (ඇ) වගන්තියේ විධි විධාන වලට යටත්ව සභාව විසින් අනුමත කරනු ලබන එක් බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාපිත මණ්ඩලයේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හා ඉටු කිරීමේ දී සංස්ථාපිත මණ්ඩලය විසින් දරනු ලබන වියදම් පිය වීමට අවශ්‍ය සියලු මුදල් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

**10.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් සහ විගණනය

(2) සංස්ථාපිත මණ්ඩලය විසින් එහි ආදායම සහ වියදම, වත්කම් සහ බැරකම් සහ සංස්ථාපිත මණ්ඩලයේ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් තබා ගැනීමට කටයුතු සැලැස්විය යුතු ය.

(3) සංස්ථාපිත මණ්ඩලයේ ගිණුම්, රජය විසින් අනුමත කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු විසින් වාර්ෂිකව විගණනය කරනු ලැබිය යුතු අතර, එකී සුදුසුකම් ලත් විගණකවරයා විසින් ඒවා සහතික කරනු ලැබිය යුතු ය.

(4) මේ වගන්තියේ කාර්යය සඳහා "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන් -

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වන්නා වූ ද, ගණකාධිකාරිවරයෙකු

වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද, එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක්,

අදහස් වේ.

**වාර්ෂික වාර්තාව**

**11.** (1) සභාව විසින්, සංස්ථාපිත මණ්ඩලයේ කටයුතු පිළිබඳ වාර්තාවක් සෑම මුදල් වර්ෂයක් සඳහාම සකස් කර, එම වාර්තාව සුදුසුකම් ලත් විගණකවරයකු විසින් විගණනය කර සහතික කරන ලද ගිණුම් ප්‍රකාශය ද සමඟ, එකී වාර්තා සහ ගිණුම් ප්‍රකාශ අදාළ වන වර්ෂයට පසුව එළඹෙන වර්ෂයේ සය මාසයක් ඉකුත් වීමට පෙර, සෞඛ්‍ය විෂය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් වෙත සහ 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීම) පනත යටතේ පත් කරන ලද ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් වාර්තාවට, මුදල් වර්ෂය තුළ දී, සංස්ථාපිත මණ්ඩලය වෙත දේශීය හා විදේශීය වශයෙන් ලැබුණු මුදල් පිළිබඳ වෙනම ගිණුම් ප්‍රකාශයක් අමුණා තිබිය යුතු ය.

**භාරය විසින් සහ භාරයට ගෙවිය යුතු මුදල්**

**12**. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයෙහි භාරය විසින් ගෙවිය යුතු සියලු ණය සහ බැරකම්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාපිත මණ්ඩලය විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, එදිනට භාරයට අයවිය යුතු සියලු ණය සහ ග්‍රාහක මුදල්, දායක මුදල් සහ සාමාජික මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාපිත මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය.

*සංස්ථාපිත මණ්ඩලයට චංචල සහ නිශ්චල දේපළ දැරිය හැකි බව*

**13**. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නියාදනයක් හෝ වෙනත් යම් ආකාරයකින් සංස්ථාපිත මණ්ඩලය සතුවන චංචල හෝ නිශ්චල යම් දේපළක් අත්කර ගැනීමට සහ දැරීමට, මේ පනතේ විධිවිධානවලට සහ වෙනත් යම් ලිඛිත නීතියකට යටත්ව, නීතියෙන් සංස්ථාපිත මණ්ඩලයට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නියාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, 7 වන වගන්තිය යටතේ සාදන ලද සංස්ථාපිත මණ්ඩලයේ රීතිවලට යටත්ව, මේ පනතේ කාර්යය සඳහා සංස්ථාපිත මණ්ඩලය විසින් ඒ සියලු දේපළ දැරිය යුතු බව.

*මුදල් සහ දේපළ අදාළ කර ගැනීම*

**14.** කවර ආකාරයකින් හෝ ලබා ගන්නා සංස්ථාපිත මණ්ඩලයේ මුදල් හා දේපළ, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථ ඉටුකර ගැනීම උදෙසා පමණක් අදාළ කරගත යුතු අතර, එයින් කවර හෝ කොටසක් සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන්ට ලාභාංශ, ප්‍රසාද දීමනා හෝ ලාභ වශයෙන් සෘජුව හෝ අන්‍යාකාරයෙන් නොගෙවිය යුතු හෝ නොපැවරිය යුතු ය.

*සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව*

**15.** (1) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී මිස, කිසිදු සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතුය. තව ද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු විසින් කරනු ලැබූ අත්සනකට පරිබාහිරව විය යුතු ය.

(2) සංස්ථාපිත මණ්ඩලයේ මුද්‍රාව, සභාව විසින් තීරණය කරනු ලැබිය හැකි සභාවේ යම් ධුර දරන නිලධරයෙකු භාරයේ තිබිය යුතු ය.

*විසුරුවා හැරීමේ දී ඉතිරි වන දේපළ*

**16.** (1) සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමේ දී, එහි සියලු ණය හා බැරකම් ගෙවා සමථයකට පත් කිරීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරි වුවහොත්, ඒ දේපළ සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයන් අතර බෙදනු නොලැබිය යුතු අතර, සංස්ථාපිත මණ්ඩලයේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද, ස්වකීය රීති අනුව යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම රීති මගින් තහනම් කර ඇත්තා වූද, වෙනත් ඕනෑම ආයතනයකට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා උචිත ආයතනය සංස්ථාපිත මණ්ඩලය විසුරුවා හැරීමට වහාම පෙරාතුවම, සංස්ථාපිත මණ්ඩලයේ සාමාජිකයින් විසින් එහි විධායක මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය.

**17**. ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාපිත මණ්ඩලයක හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු බව.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

**18.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මෙම පනතෙහි -

අර්ථ නිරූපණය

"බැංකුව" යනුවෙන් අදහස් කරනු ලබන්නේ 1988 අංක 30 දරන බැංකු පනතෙහි ප්‍රතිපාදන යටතේ බලපත්ලාභී බැංකුවක්;

"නීතිය" යන පදගත සම්බන්ධය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 ව්‍යවස්ථාවෙහි ඊට ලබා දී ඇති අර්ථ නිරූපණයන්ට අදාළ අර්ථයම; සහ

"ලිඛිත නීතිය" යන පදගත සම්බන්ධය සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 ව්‍යවස්ථාවෙහි ඊට ලබා දී ඇති අර්ථ නිරූපණයන්ට අදාළ අර්ථයම ලබා දී ඇත.

**19**. මේ පනතෙහි සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව